# සමස්ථ ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමයේ ව්‍යවස්ථා මාලාව

01 . සමිතියේ නම :-

සමස්ථ ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල) නිළධාරී සංගමය.

02 . ලියාපදිංචි කාර්යාලය :-

ලේකම්
අංක 68
දෙහිදෙනිය
පේරාදෙනිය

03 . පරමාර්ථ :-

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි බැංකු සංගම් , මහා සංගම් , කාර්යාල හා කෙෂ්ත්‍ර ගත රාජකාරීන්හි නියුතු සියලු සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සමිතිය යටතේ මැනවින් සංවිධාන ගත කිරීම.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි බැංකු සංගම් , මහා සංගම් හා කාර්යාල ගත රාජකාරීන්හි නියුතු සියලු සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ සේවය කාර්යක්‍ෂම කිරීම හා මහජනතාවට අත්‍යවශ්‍ය ඵලදායී සේවාවක් බවට පත් කිරීම.

සමස්ථ සාමාජිකයින්ගේ ලාභ ප්‍රයෝජන,අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳව පරීක්‍ෂාවෙන් සිටිමින් ඒවා වැඩිදියුනු කිරීම හා ආරක්‍ෂා කිරීමට කටයුතු කිරීම.

(එ) **සමස්ථ සාමාජිකයින්ගේ සුභ සාධන කටයුතු වැඩිදියුනු කිරීම සඳහා සුභ සාධන අංශයක් ස්ථාපිත කොට එය දියුනු කරමින් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.**

සමස්ථ සාමාජිකයින්ට පහත සඳහන් ප්‍රයෝජනයන්ගෙන් එකක් හෝ සියල්ලම සපයා දීම.

( 1 ) සාමාජිකයින්ගේ ආර්ථික තත්වය නගා සිටුවීම.

( 11 ) වෘත්තිය අරගල වලදී සහ සේවා ස්ථානයේදී සාමාජිකයින්ට එල්ලවන පලිගැනීම් ක්‍රියාවන්හිදී සහනය හා ඔවුන්ගේ රැකියාවේ සුරක්‍ෂිත භාවය වෙනුවෙන් පෙනී සිටීම.

( 111 ) සාමාජිකයින්ට රැකියාව සම්බන්ධයෙන් අවශ්‍ය වූ විටක නීතියේ පිහිට හා නීති උපදෙස් ලබා දීමට කටයුතු කිරීම.

සමිතිය හා වෙනත් සමිති අතරද සාමාජිකයන් හා ඔවුන්ගේ සේවය අතරද සමිති සාමාජිකයින් හා වෙනත් සමිතිවල සාමාජිකයින් අතරද සුහදත්වය හා සම්බන්ධය වර්ධනය කිරීම.

වෘත්තීය අරගල වලදී මූලිකත්වය ගැනීම හා නිවැරදි නායකත්වයක් ලබා දෙමින් සාමාජිකයින් වෙනුවෙන් පෙනී සිටීම.

04 . සාමාජික නාමාවලිය :-

දිනෙන් දිනට යාවත් කාලීන කරන ලද සාමාජිකයින්ගේ නාමාවලියක් හා දිස්ත්‍රික් සංවිධාන ව්‍යුහයට අදාල වාර්ෂිකව යාවත්කාලීන වන නියෝජිතයින්ගේ නාමාවලියක් පවත්වාගෙන යාම ගැන ලේකම් තැන වගකිවයුතු වේ.

05 . පොත්පත් පරීක්ෂාව :-

සංගමයේ ඕනෑම සක්‍රිය සාමාජිකයකුට හෝ කිහිප දෙනෙකුට හෝ අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවකදී සමිති සතු මුදල් / මුදල් පොත්පත් සාමාජික නාමාවලිය ඇතුලු සියළුම දෑ පරීක්ෂා කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක ඒ බව ලේකම් තැනට දින 21 ට පෙර දැනුම් දී අවස්ථාව ලබාගත හැකි අතර එවැනි අවස්ථා වල ප්‍රධාන නිළධාරීන් 03 දෙනා ඇතුළු නිළධාරීන් පස්දෙනෙකුගෙන් යුත් කමිටුවක් ඉදිරියේ ලිපිය ලැබී දින 14 ක් ඇතුලත එම අවස්ථාව ලබාදිය යුතුය ( එම කමිටුව කැඳවීම ලේකම් වරයා සතු වගකීම වන්නේය

සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර ගනන් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ගතයුතු අතර ඔවුන් මාස හයකට වරක් සියලු ගණුදෙණු පිළිබඳව පරීක්ෂාවට ලක් කොට ඒ පිළිබඳ වාර්තාවක් විධායක සභාවට ඉදිරිපත් කළ යුතුය

සියලුම ගෙවීම් ලේකම් හෝ සභාපති සමග භාණ්ඩාගාරික තැන විසින් සිදුකළ යුතු අතර විධිමත් ගෙවීම් වව්චරයක් ඒ සඳහා භාවිතා කළ යුතුය

06 . වාර්ෂික මහා සභා රැස්වීම :-

සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව යන්න

**අප සංගමය දීපව්‍යාප්ත සංගමයක් වන බැවින් වාර්ෂික මහා සභා රැසවීමට අදාල සාමාජික සංඛ්‍යාව වශයෙන් සමස්ථ සාමාජික සංඛ්‍යාව නොව දිස්ත්‍රික් ශාඛාවන් නියෝජනය කරණු ලබන දිස්ත්‍රික් සභාපති,උප සභාපති,ලේකම්,උප ලේකම් හා භාණ්ඩාගාරික යන 05 දෙනාබැගින් වන සාමාජිකත්වය දරණ සමස්ත දිස්ත්‍රික්කයන්හි ඉහත සඳහන් කළ නිළධාරීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම දිස්ත්‍රික් නියෝජිත සංඛ්‍යාව ඇතුලත් සාමාජික සංඛ්‍යාව වශයෙන් ගණන් ගතයුතු වන්නේය. යනුවෙන් සංශෝධනය විය යුතුය.**

සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමක් වර්යෙන් ( අපේල් මස 01 දින සිට මාර්තු 31 දක්වා ) පසුව එළඹෙන ජුනි මස 30 දිනට ප්‍රතම පැවැත්වියයුතු

වන්නේය.( මෙම රැස්වීම සඳහා අවශ්‍ය ඝණ පූරණය රැස්වීමට සහභාගී වීමට බලය ඇති සාමාජික සංඛ්‍යාවෙන් යටත් පිරිසෙන් 2/3 ක් විය යුතුය

සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට සති 03 ට කලින් ඒ බව ලේකම් තැන විසින් සිය සාමාජිකයන්ට දැනුම් දිය යුතුය

රැස්වීම පිළිවබඳ නිවේදනයේ දින සිට දින 14 ක් ඇතුලත සාමාජිකයන් තමන් විසින් ඉදිරිපත් කිරීමට අදහස් කරණ යෝජනා ව්‍යවස්ථා සංශෝදන ලේකම් තැන වෙත එවිය යුතුය

ලේකම් තැන විධායක මණ්ඩලය විමසා වාර්ෂික මහා සභා රැස්වීම සඳහා ඉහත ( ඉ ) වගන්තියේ සඳහන් යෝජනා ඇතුලත් කොට න්‍යාය පත්‍රයක් පිළියෙළ කොට එය මහා සභා රැස්වීම පැවැත්වීමට දින 07 ට කලින් සාමාජිකයන්ට ලැබෙන්නට සැලැස්විය යුතුය

07 . විශේෂ මහා සභා රැස්වීම :-

සභාපති තැන විසින් හෝ විධායක මණ්ඩලයේ තීරණය මත හෝ දින 28 ක් කල්දෙමින් දිස්ත්‍රික් සංවිධාන ව්‍යුහයේ සාමාජිකයින්ගෙන් 2/3 ට නොඅඩු සාමාජික පිරිසක් අත්සන් කර ලේකම් තැන වෙත ඉදිරිපත්කළ ලියවිල්ලකින් ඉල්ලුම් කළවිට හෝ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය ඉල්ලා සිටීම හෝ තීරණය හෝ ඉල්ලීම් කළ දින සිට දින 14 ක් ඇතුලත රැස්වීමේ අරමුණ දන්වා යවමින් ලේකම් තැන විශේෂ මහා සභා රැස්වීම කැඳවිය යුතුය එසේ දන්වා යැවූ අරමුණහැර වෙන කිසිදු කරුණක් එම රැස්වීමේදී සාකච්ඡා නොකළ යුතුය ( කවර විශේෂ මහා සභා රැස්වීමකට වුවද අවශ්‍ය ඝණ පූරණය වාර්ෂික මහාසභා රැස්වීමකට අවශ්‍ය ඝණ පූරණය වන්නේය )

08 . විධායක මාණ්ඩලික රැස්වීම :-

අවශ්‍ය අවස්ථාවන්හිදී හෝ අඩුම වශයෙන් මසකට වරක් විධායක මාණ්ඩලය රැස්විය යුතුය ( ඝණපූරණය විධායක මාණ්ඩලයෙන් 2/3 ක් සහභාගී විය යුතුය )

09 . වාර්තා :- සෑම රැස්වීමකම වාර්තාවක් සටහන් කර ගැනීමත් එය ඊලග එවැනිම රැස්වීමකදී කියවා සම්මත කරගැනීම පිළිබඳවත් ලේකම් තැන වගකිවයුතු වේ

10 . ඡන්දය විමසීම :-

රැස්වීමට පැමිණි වැඩි දෙනාගේ ඉල්ලීම මත රහස් ඡන්දයක් විමසිය යුතු වූ විට හැර අන් සෑම අවස්ථාවකදීම ඡන්දය දීම අත් එසවීමෙන් කළයුතු වන්නේය

11 . සාමාජිකත්වය :-

**සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි බැංකු , මහා සංගම් , විවිධ කාර්යාලයන්හි හා ග්‍රාම නිළධාරී වසම් වලට අනුයුක්ත කොට ඇති සියලුම සමෘද්ධි සංවර්ධන නිළධාරී සේවයේ නියුක්ත (මාණ්ඩලික නිළධාරීන් වන / x ) වයස අවුරුදු 16 ට වැඩි ස්ත්‍රී / පුරුෂ ඕනෑම කෙනෙක් මෙහි සාමාජික්වය ලැබීමට සුදුසුකම් ලබයි යනුවෙන් සංශෝදනය විය යුතුය.**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි බැංකු , මහා සංගම් , හා විවිධ කාර්යාලයන්හි අනුයුක්ත කොට ඇති සියලුම සමෘද්ධි සංවර්ධන නිළධාරීන් මෙහි සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබයි

සම්මාන හෝ තාවකාලික සාමාජිකයන් පත්කර ගත නොහැකිය

සංගමයේ සාමාජිකත්වය ඉල්ලා සිටින සෑම කෙනෙකුම සංගමයේ නියමිත ආකෘති පත්‍රයෙන් එම ඉල්ලීම කළ යුතුය එවිට ලේකම් තැන විසින් සාමාජිකත්වය ලබාදිය හැකිය එසේ වුවද පසුව එළඹෙන ඊලග පළමු විධායක සභාවට ඉදිරිපත් කළ යුතුය එහිදී සාමාජිකයා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය බවට ඔප්පු වුවහොත් හෝ සාමාජිකත්වය සඳහා ඕනෑම කෙනෙකු කරණ ඉල්ලීමක් හේතු නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ බලය විධායක සභාවට ඇත

සංගමයේ ව්‍යවස්ථාව කඩකළ බව ඔප්පුවූ කවර සාමාජිකයකුගේ වුවද සාමාජිකත්වය තාවකාලික වශයෙන් හෝ සම්පූර්ණයෙන් තහනම් කිරීමට විධායක සභාවට බලය ඇත්තේය එහෙත් එසේ කළ විට ඒ ක්‍රියාව ස්ථිර කිරීම සඳහා හෝ ඒ පිළිබඳව වැඩි දුරටත් ක්‍රියා කිරීම සඳහා එම කරුණ ඊලග මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය

12 . කළයුතු ගෙවීම් :-

(අ) සාමාජික මුදල රු 20 යන්න

**සෑම සාමාජිකයකු විසින්ම මාස්පතා දායක මුදල් වශයෙන් රු 50 ක මුදලක් ගෙවිය යුතුය මේ දායක මුදල් ප්‍රමාණය වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී හෝ වෙනස්කළ හැක. යනුවෙන් සංශෝදනය විය යුතුය.**

අවශ්‍යවූ විටක විශේෂ ආධාර මුදල් ඉල්ලා සිටීමට විධායක සභාවට බලය ඇත්තේය

සමිතියට ගෙවනු ලබන්නා වූ සෑම මුදලක් වෙනුවෙන්ම භාණ්ඩාගාරික තැන කුවිතාන්සියක් නිකුත්කළ යුතු වන්නේය (සාමාජික මුදල් හැර )

සමිතිය මගින් කරනුලබන සෑම ගෙවීමක්ම ගෙවීම් වව්චරයක් මගින් කළ යුතු වන්නේය

13 . දඩගැසීම් හා අහිමි කිරීම් :-

සාමාජිකයන්ට දඩ ගසනු නොලැබේ

සංගමයේ ව්‍යවස්ථාව උල්ලංගනය කරන්නා වූ හෝ මාස හයකට වඩා වැඩි කාලයක් දායක මුදල් හිඟව තබන්නා වූ හෝ සියළුම සාමාජිකයින්ට ඒ හේතුවෙන්ම සාමාජිකත්වය අහිමි වනවා මෙන්ම ඔවුනට සංගමයෙන් සැලසෙන සියළුම අයිතිවාසිකම් හා සියළු වරප්‍රසාද අහිමි වන්නේය

14 . ව්‍යවස්ථා :-

මෙම ව්‍යවස්ථාවේ අඩු වැඩි කිරීම් වෙනස් කිරීම් ආදි කවර ක්‍රමයකින් හෝ සංශෝදනයක් කරන්නේනම් එසේ කළ හැක්කේ වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී හෝ පැමිණ සිටින ඡන්ද බලය හිමි සාමාජිකයින්ගෙන් 2/3 කකගේ අනුමත වූ යෝජනාවකින් පමණි එහෙත් සංගමයේ නාමය වෙනස් කිරීමේදී ඡන්දය විමසීමකින් හෝ තිරණය කරන්නා වූ අන් අයුරකින් කැමැත්ත ලබා ගතයුතුය

මෙම ව්‍යවස්ථාවේ 15.4 කොටස කිසිඳු හේතුවක් මත වෙනස් නොකළ යුතුය

15 . විධායක මණ්ඩලය :-

විධායක මණ්ඩලයට , සභාපති , උප සභාපති , ලේකම් , උප ලේකම් භාණ්ඩාගාරික සහ තවත් විධායක සභිකයින් 06 දෙනෙකුගෙන්ද සමන්විත විය යුතුය.මේ සියළුදෙනාම වාර්ෂික මහා සභා රැස්වීමකදී විධායක මණ්ඩලයේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් අඩකට නොඅඩු ගණනක් සමිතියේ සාමාජිකයින්ගෙන් යුක්ත වනපරිදි පත්කරගත යුතුය.

වයස අවුරුදු 21 ට අඩු කිසිවෙකු විධායක මණ්ඩලයට තෝරා පත්කර ගත නොහැකිය.

එක දිගටම වසර 03 ක් හෝ එයට වැඩි කාලසීමාවක් සඳහා විධායක සභාවේ ඒකමතික තීරණය අනුව ජාතික සංවිධානයේ ප්‍රධාන තනතුරුවල රැඳීසිටිය හැක එසේ වුවද වාර්ෂිකව මහා සභාවේ යෝජනා ස්තිරත්වයෙන් ඔවුන් තෙරීපත්විය යුතුය.

සංගමයේ ප්‍රධාන නිලතල දරණු ලබන කිසිවෙකු එම තනතුරෙහි කටයුතු කරමින් කුමන හෝ පක්ෂයකින් මැතිවරණ අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් නොවිය යුතුය

16 . නිළධාරීන්ගේ වගකීම :-

ඉල්ලා අස්වීම නැවත තේරී පත් නොවීම නිලයෙන් පහ කිරීම හා නිළය තහනම් කිරීම යන අවස්ථාවලදී ධූරයෙන් ඉවත්වී යන සමිතියේ සෑම ලේකම් වරයෙකුම තමා භාරයේ ඇති සමිතියේ සටහන් පොත් පත් හා සමිතිය සතු සියලුම ලිපිගොනු ඔහු වෙනුවට ලේකම් ධූරයට පත්වන අයට හෝ සමිතියේ සභාපති වරයාට තමා ධූරයෙන් ඉවත් වී සතියක් ඇතුලත භාර දිය යුතුය

විශේෂයෙන් වෘත්තීය සමිති ආඥා පනත යටතේ පැවරෙන නීතිමය වගකීම් සියල්ල සම්පූර්ණ කිරීම සඳහා සමිතියේ ලේකම් වගකිව යුතුය ආඥා පනතේ

50 ( 1 ) හා ( 2 ) වගන්තිවල සඳහන් ප්‍රතිපාදන අනුව වාර්ෂික වාර්තා වෘත්තීය සමිති රෙජිස්ටාර් වරයා වෙත නියමිත කාලසීමාව තුලදී සැපයිය යුතුය

මෙම සංගමයේ සෑම භාණ්ඩාගාරික වරයෙකු විසින්ම එහි ගණන් හිලව් ගැන නිවැරදි සටහන් තබාගැනීමට වගකීමෙන් බැඳේ එසේම මුදල් එකතු කිරීම හෝ වියදම් කිරීම හෝ තබා ගැනීම හෝ පාලනය ගැන වගකිව යුතුය

සෑම මාස 03 ට වරක් රැස්වෙන විධායක සභාවට අදාල කාලයට සැකසූ අයවැය වාර්තාවක් ඉදිරිපත් කර යෝජනා ස්ථිර කර ගැනීමට වගකීමෙන් බැඳී සිටී

ඔහු ධූරයෙන් ඉල්ලා අස්වන විටක හෝ ධූරය අත්හරින විටක හෝ අවුරුද්දට වරක් එම සමිතියේ සාමාජිකයන් විසින් යෝජනාවකින් ඉල්ලන පරිදි හෝ එහි ව්‍යවස්ථාවල දැක්වෙන පරිදි හෝ තමා ධූරයට පත්වූ දින සිට පසුවුනු කාලය අතරතුර ලබන ලද හෝ ගෙවන ලද මුදල් පිළිබඳව අයවැය වාර්තාවක් වෘත්තීය සමිති ආඥා පනතේ 49 වැනි වගන්තියෙන් නියමකර ඇති පරිදි වෘත්තීය සමිතියට හා සාමාජිකයන්ට ඉදිරිපත් කළ යුතුය

17 . ගණන් පරීක්ෂක :-

වෘත්තීය සමිති ආඥා පනතේ රෙගුලාසි මාලාවේ 20 වැනි රෙගුලාසියට අනුව සමිතියේ ගණන් හිලව් පරීක්ෂා කිරීම පිණිස වෘත්තීය සමිති රෙජිස්ටාර් වරයාගේ අනුමැතිය පිට විධායක මණ්ඩලය විසින් ගණන් පරීක්ෂක වරයකු පත්කරගත යුතු වන්නේය ගණන් පරීක්ෂා කිරීම සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමට පෙර සම්පූර්ණ කළයුතු වන්නේය

18 . භාරකාරවරු :-

අඩු ගණනේ භාරකාරවරු තිදෙනෙකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් විධායක සභාව විසින් තෝරා පත්කර ගත යුතුය ඔවුන් සංගමයේ නිළධාරීන් හෝ සාමාජිකයන් අතුඅරින් විය හැකිය සංගමය සතු සියළුම නිශ්චල හා චංචල දේපල ඒ ඒ කළට සිටින භාරකාරවරුන් භාරයේ තිබිය යුතුය ඔවුන් ඒ දේපල සම්බන්ධයෙන් විධායක සභාවේ විධානයන්ට අනුව කටයුතු කළයුතු වන්නේය.

19 . නිළයෙන් ඉවත් කිරීම :-

පත්කර ගනුලැබූ ඕනෑම විධායක නිළධාරියෙකු ගණන් පරීක්ෂකයකු හෝ භාරකරුවකු මහා සභා රැස්වීමකදී ඊට පැමිණ සිටින සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකොටසකින් සම්මතවූ යෝජනාවකින් මිස වෙන අන් ලෙසකින් නිළයෙන් ඉවත් කළ නොහැක්කේය.එසේ වූ නමුත් එබඳු කවර කෙනෙකු වුවද තාවකාලිකව නිළයෙන් අත්හිටවීමට විධායක මණ්ඩලයට බලය ඇත.එසේ කළ කල්හි ඒ ගැන වැඩිදුරටත් ක්‍රියා කිරීම සඳහා හෝ විධයක මණ්ඩලය ගත් පියවර ස්තිර කිරීම සඳහා හෝ එම කරුණ මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. මහා සභා රැස්වීම් දෙකක් අතරතුර කාලයේදී ඇතිවන ඇබෑර්තු විධායක මණ්ඩලය විසින් පිරවිය යුතුය.

20 . අරමුදල් :-

සමිතියේ අරමුදල් ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ සඳහන් පරමාර්තයන් මුදුන්පත් කර ගැනිම පිණිස මිස කිසිම තැනැත්තෙකුට උසාවියේ නඩු තින්දුවකින් හෝ ආඥාවකින් ගෙවීමට නියමවන දඩයක් ගෙවීම පිණිස කවර ආකාරයකින් හෝ යෙදිය නොහැක්කේය වෙන අන් කරුණක් වෙනුවෙන්ද මුදල් වැය නොකළ යුතු වන්නේය

සමිතියේ අරමුදල් මුදල් පහත සඳහන් (ඊ) අනුඡේදයෙන් යටත්ව විධායක මණ්ඩලය යෝජනා කරණු ලබන වාණිජ බැංකුවක සංගමයේ නාමයෙන් යුතු ගිණුමක තැන්පත් කළයුතු වන්නේය බැංකු ගි)ණුම ආරම්භ කළ වහාම බැංකුවේ නම හා ගිණුම් අංකය වෘත්තිය සමිති රෙජිස්ට්‍රාර්වරයාට දැන්විය යුතුය

භාණ්ඩාගාරික සමග ප්‍රධාන ලේකම් හෝ ප්‍රධාන සභාපති ගේ අත්සනින් මුදල් ආපසු ගැනීම කළයුතු වන්නේය

(ඉ) භාණ්ඩාගාරික අත ඉතිරිය රු 500.00 යන්න

**ලැබෙන සියලු මුදල් ගිණුමේ තැන්පත් කළයුතු අතර අවශ්‍යතාවයන් සඳහා රු 5000.00 ක මුදලක් අත ඉතිරිය වශයෙන් ලග තබාගත හැක.** යනුවෙන් **සංශෝදනය විය යුතුය.**

**විශාල මුදල් එකතුවක් වන්නේනම් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළ යුතු වන්නේය.**

21 . විසුරුවා හැරීම :-

සමිතියේ විසුරුවා හැරීමක් සමිතියෙන් ගෙවිය යුතු සියළු නීත්‍යානුකුල වියහියදම් ගෙවීමෙන් පසු එහි අරමුදල් ගැන ක්‍රියා කිරීමත් ඒ සඳහා කැඳවන ලද විශේෂ මහා සභා රැස්වීමකදී ඊට පැමිණ සිටින ඡන්ද බලය හිමි සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකොටසකට සම්මතවූ යෝජනාවකින් තිරණය වන පරිද්දෙන් කළ යුතුය.සමිතිය විසුරුවා හැරීමෙන් දින 14 ක් ඇතුලත ඒ බව රෙජිස්ට්‍රාර්වරයාට නියමිත ආකෘතියකින් දන්වන අතර ලියාපදිංචි කිරීමේ සහතිකය ආපසු එවිය යුතුය. සමිතියේ ලියාපදිංචි කිරීමේ සහතිකය වෘත්තිය සමිති රෙජිස්ටාර්වරයා විසින් අවලංගු කළෙහි නම් සමිතියේ ලේකම් ඒ සම්බන්ධයෙන් රැස්වීමක් කැඳවා සාමාජිකයන්ට ඒ බව දන්වා සමිතියෙන් ගෙවිය යුතු සියළු නීත්‍යානුකුල වියහියදම් ගෙවීමෙන් පසු එහි අරමුදල් ගැන ක්‍රියාකර වෘත්තිය සමිති ආඥාපනතේ 16 (1) වගන්තිය යටතේ ක්‍රියා නොකරන්නේ නම් සමිතිය විසුරුවා හැර සමිතියේ ලියාපදිංචි කිරීමේ සහතිකය රැස්වීමෙන් දින 14 ඇතුලත වෘත්තිය සමිති රෙජිස්ටාර්වරයා වෙත යැවිය යුතුය.

22 . සීමා කිරීම් :-

සමිතියට අනුසාසකයෙකු පත් කර ගන්නේ නම් ඒ සඳහා සාමාජිකයෙකු පත්කර ගත යුතුය.

මෙම ව්‍යවස්තාව වෙනස් කිරීම හෝ කරුණු අඩු වැඩි කිරීම සිදු කිරීම කළ හැක්කේ මහා සභාවකදී පමණි

...................................................

ලේකම් තැනගේ /සම ලේකම්වරුන්ගේ අත්සන

200***5.09.22*** වන දිනදීය.
(ව්‍යවස්ථා මාලාව සභා සම්මත වූ දින)

වැදගත් :-

| | |
|---|---|
| 1. දෙපාර්තමේන්තු ප්‍රදානීන්ගේ නම සහ ලිපිනය (රජ්‍ය/සංස්ථා/පරිපාලන) | රවීන්ද්‍ර හේවාවිතාරණ<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය , 04 වන මහල<br>සෙත්සිරිපාය , බත්තරමුල්ල |
| දුරකථන අංකය | 0112872202 |
| 02. සමිතිය ලියාපදිංචි ලිපිනයට ආසන්න දුරකථන අංකය | 081 - 2385152 ( කාර්යාල)<br>081 – 2410602 (නිවස) |

---

X රජයේ සේවකයන්ගේ සියළුම සමිතිවලට මෙය අදාල වේ.

XX රජයේ මාණ්ඩලික නිළධාරීන්ගේ සහ සාම නිළධාරීන්ගේ සමිති වලට පමණක් අදාල වේ

XXX රජයේ මාණ්ඩලික නිළධාරීන්ගේ සහ සෑම නිළධාරීන්ගේ සමිති වලට පමණක් අදාල වේ